තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිට දී ය

**ටී ඒ ඩී ටී සේනානායක එ ජාතික පොලිස් කොමිෂන් සභාව**

RTIC Appeal (**පුද්ගලික වශයෙන් විභාග කිරීම**)/290/2018 / (2018.07.24 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය)**,** රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ කිශාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන්
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්:** පියතිස්ස රණසිංහ

**අභියාචක** - ටී ඒ ඩී ටී සේනානායක
**නොතිසි ලත් පාර්ශවය** - ලේකම්, ජාතික පොලිස් කොමිෂන් සභාව

**පෙනීසිටීම**
අභියාචක - ටී ඒ ඩී ටී සේනානායක
පොදු අධිකාරිය - පී ඩී ලියනාරච්චි - මාධ්‍ය නිලධාරී
ඒ එම් එස් මුණවීර - සහකාර ලේකම්

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018.01.02 |
| තොරතුරු නිළධරයා තීරණය ලබා දුන් දිනය | 2018.02.14 |
| නම් කල නිළධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.02.14 |
| නම් කල නිළධරයා තීරණය ලබා දුන් දිනය | 2018.03.07 |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2018.03.08 |

**අභියාචනයට පසුබිම්වූ කරුණු:**

අභියාචක 2018.01.02 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත සඳහන් අභියාචනා වලට අදාළ විධිමත් විනය පරීක්ෂණ ගොනු සහ මූලික විමර්ශන ගොනු වල පිටපත් ඉල්ලා සිටින ලදී.

1. *ED/12/3/11 දරණ විනය නියෝගයට එරෙහිව ඉදිරිපත් කරන ලද අභියාචනය (NPC/APL/DIS/77/15 PSC)*
2. *ED/12/01/09 දරණ විනය නියෝගයට එරෙහිව ඉදිරිපත් කරන ලද අභියාචනය (NPC/APL/02/509/12 PSC)*

3. *ED/11/19/09 දරණ විනය නියෝගයට එරෙහිව ඉදිරිපත් කරන ලද අභියාචනය (NPC/APL/78/15 PSC)*
4. *ED/12/06/10 දරණ විනය නියෝගයට එරෙහිව ඉදිරිපත් කරන ලද අභියාචනය (NPC/APL/DIS/225/15)*

තොරතුරු නිලධාරියා 2018.02.14 දිනැතිව පිළිතුරු සපයමින් පවසා සිටියේ අභියාචකට ඉහතින් සඳහන් විමර්ශන ගොනු වල පිටපත් පොලිස්පති තුමාගෙන් ලබාගත හැකි බවයි. මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක 2018.02.14 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධරයා 2018.03.07 දිනැතිව ප්‍රතිචාර දක්වමින් පවසා සිටියේ ඉල්ලා ඇති ලිපිගොනු සම්බන්ධයෙන් අභියාචනා විනිශ්චය අධිකාරියේ අභියාචනා 4ක් විභාග වෙමින් පවතින හෙයින් එම තොරතුරු ලබා දිය නොහැකි බවයි. මෙම තීරණයෙන්ද අභියාචක සැහීමකට පත් නොවූ හෙයින් 2018.03.08 දිනැතිව අභියාචක කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

අභියාචක, ප්‍රධාන පොලිස් පරීක්ෂකයෙකු ලෙස සේවයේ නියුතුව සිටියදී උසස් නිලධාරියෙකු ලබාදුන් නිත්‍යානුකූල නොවන නියෝගයක් ඉටු නොකිරීම හේතුවෙන් තමාට අසාධාරණ ලෙස චෝදනාපත් ගොනු කර ඇති බවත්, තම නිර්දෝෂී භාවය ඔප්පු කිරීමට තමාට මෙම තොරතුරු අවශ්‍ය වන බවත් පවසා සිටියේය.

මෙයට පිළිතුරු ලබාදුන් පොදු අධිකාරිය පවසා සිටියේ, ලිපිගොනු පරිපාලන විනිශ්චය අධිකාරිය සතු වූ නිසා අභියාචකට ලබා දීමට නොහැකි වූ බවයි. තවද, 2018.07.20 දිනැති ලිපියෙන් පොලිස් කොමිෂන් සභාවේ ලේකම්, පරිපාලන විනිශ්චය අධිකාරියේ විනිශ්චය මඩුල්ල විසින්, අභියාචක ඉල්ලා සිටි තොරතුරු ගාස්තුවකට යටත්ව ලබා දීමට හැකි බව පවසා ඇති බවට කොමිෂන් සභාවට දන්වා ඇති බවට පොදු අධිකාරිය පවසා සිටින ලදී.

**නියෝගය:**
පොලිස් කොමිෂන් සභාවේ ලේකම්, 2018.07.20 දිනැති ලිපියේ සඳහන් කර ඇති අයුරින් ඉල්ලා සිටින ලද තොරතුරු අභියාචකට සති 4ක කාලයක් ඇතුළත ලබා දීමට මෙයින් නියෝග කර සිටිමු.

පොදු අධිකාරිය තොරතුරු ලබා දීමට එකඟ වීමේ කොන්දේසියට යටත්ව මෙම අභියාචනය මෙයින් අවසන් කෙරේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කිරීමට නියෝග කර සිටිමු.
*********

……………………………………………………
මහින්ද ගම්මම්පිල - සභාපති

……………………………………………………
කිශාලි පින්ටෝ ජයවර්ධන - කොමිෂන් සභා සාමාජිකා

……………………………………………………
එස්. ජී. පුංචිහේවා - කොමිෂන් සභා සාමාජික

……………………………………………………
සෙල්වී තිරුචන්ද්‍රන් - කොමිෂන් සභා සාමාජිකා

……………………………………………………
රෝහිනී වල්ගම - කොමිෂන් සභා සාමාජිකා